# කෘෂිකර්ම අධ්‍යක්ෂක තුමාගේ පණිවුඩය



මෙරට කෘෂිකාර්මික සංවර්ධනය කඩිනම් කිරීමට නම් කෘෂිකර්මයෙහි යෙදී ඇති අති විශාල ජනකායට පහසුවෙන් අවබෝධ කර ගැනීමට හා ප්‍රයෝජනයට ගත හැකි පිළිවෙළට මෙම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සොයා ගැනීම් හා පැළ ද්‍රව්‍ය ආදිය ඔවුන් වෙත සැපයිය යුතු වෙයි. ගොවිකම් සඟරාව කෘෂිකාර්මික සංවර්ධනයට අත්‍යවශ්‍ය ආයුධයක් වශයෙන් දැන් පිළිගෙන ඇති බවට මෑතකදී මෙම ප්‍රකාශනයෙහි අලෙවිය තුන් ගුණයකින් වැඩි වීමෙන් අපට ප්‍රත්‍යක්ෂ වෙයි.

හැකි පමණ කෙටි කලෙකින් මෙම රට ආහාර අතින් ස්වයංපෝෂිත කිරීමේ අපේ අභිලාෂය මුදුන් පමුණුවා ගැනීම උදෙසා කාර්මික වූද ක්‍රියාත්මක කළ හැකි වූද, තොරතුරු දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ හා මහජනයාගේ ප්‍රයෝජනය සඳහා මෙම සඟරාව මගින් ඉදිරිපත් කිරීමට මෙම සඟරාවට විධිමත් පිළිවෙළට ලිපි ආදිය මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සපයනු ඇතැයි මම අපේක්ෂා කරමි.

1966 මාර්තු 1 දින,
කොළඹ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

ඩී. සී. ඇල්. අමරසිංහ